**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020අප්‍රේල් 20දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව2020 ජුනි 30 දින දවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ දක්වා තිබුණු (අ), (ආ), (ඉ), (ඊ), (එ), (ඔ), (ක), (ග), (ච) යන ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි නොකර සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | අවශ්‍ය නිවැරදිකිරීම් කළ යුතුවේ. | ජර්නල් සටහන් යොදා එය නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| (ආ) | ශේෂ පිරික්සුම අනුව සෞඛ්‍ය සේවා වැඩ සටහන යටතේ ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර වියදම රු.336,103 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු.183,019 ක් විය. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජ'ර්නල් සටහන් යොදාගෙන එය නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | ශේෂ පිරික්සුමේ දැක්වෙන ගිණුම් ශේෂ 13ක එකතුව රු. 14,596,261 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පුස්තකාල තැන්පත්, යන්ත්‍රෝපකරණ තැන්පත්, තාක්ෂණික තැන්පත් යන ගිණුම් පෙර වර්ෂවල සිට පැවත එන ගිණුම් බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.2,932,169 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | වරිපනම් බදු හිඟය අඩුවෙන් දක්වා තිබීම නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඉ) | ලැබිය යුතු ගිණුම් 10 ක වර්ෂ අවසාන ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු අතර 2017, 2018 හා 2019 වර්ෂ 03 හිම එකම වටිනාකම් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | Excel වැඩ පත්‍රිකා සම්බන්ධ කරගෙන ගිණුම් පිළියෙල කිරීමේදී සිදුවූ අත්වැරදීම් දෝෂයක් හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ වටිනාකම් මෙම ගිණුම්වල සටහන් වී නොමැති අතර එසේ වෙනස් වන ගිණුම් ශේෂ නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.1,444,071 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | අත්වැරදීම්, දෝෂයන් හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණ රු. 1,444,071 වැඩියෙන් ගිණුම්ගත වී ඇති අතර එය නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,044,050 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ හිඟය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වීම අත්වැරැද්දකින් සිදු වී ඇති අතර එය නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.11,848,605 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | අත්වැරදීමකින් ලැබිය යුතු මුද්දර ගාස්තු අඩුවෙන් සටහන් වී ඇති අතර එය නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු කුලී ගිණුම් ශේෂය රු.2,431,451 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු කුලී ගිණුමේ ශේෂය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වීම නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගනු ලැබූ වටිනාකම රු.2,467,076 ක් වූ භාණ්ඩ තොගයක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | රු. 2,467,077 ක් වූ භාණ්ඩ තොගයක් ගිණුම්ගත කිරීම අත්හැරී තිබීම ජර්නල් සටහන් මගින් ගැළපූ බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද වටිනාකම රු.7,180,233 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 09 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | සංවර්ධන ව්‍යාපෘති 09 ක වටිනාකම නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් බැංකුව විසින් ස්ථාවර නියෝග අනුව ගෙවා තිබූ රු.791,146ක් හා බැංකු ගාස්තු රු.7,550 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සෘජු හර හා බැර හදුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ණය වාරික ගෙවීම සඳහා බැංකුව විසින් ස්ථාවර නියෝග අනුව ගෙවූ රු. 791,146 මුදල හා බැංකු ගාස්තු රු. 7,550 සටහන් නොවීම ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.88,582 ක් වූ අත ඉතිරි මුදල් ශේෂය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ග) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 10 කට අදාළව පැවති ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු. 74,027,258 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ජ'නල් සටහනක් මගින් නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| (ච) | ගිණුම් විෂයයන් 09 කට අදාළව වටිනාකම රු.20,866,612 ක් සඳහා විස්තරාත්මක තොරතුරු සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන සාක්ෂි මූලාා ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | විස්තරාත්මක උප ලේඛන සහිතව ගිණුම් පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 159 (1) වගන්තිය | පොදු පහසුකම් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කඩ කාමර 10 කින් හිඟ කඩ කුලී රු.676,550 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට ලිපි යවා ඇති අතර නියමිත කාලය තුල ගෙවීමට කටයුතු නොකරන කඩහිමියන්ට නීත්‍යානුකූලව කටයුතු කරන බව කාරුණිකව වාර්තා කරමි. |

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති
---------------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | රීති 32-42 | 2019 දෙසැම්බර් 31 දිනට මාර්ග 17 කට අයත් දේපල 2202 කින් රු.5,074,508 ක වරිපනම් බදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතුවේ. | 2020 වර්ෂය තුල එකී හිඟ මුදලින් රු. 492,066.43 ක මුදලක් අයකරගෙන ඇති අතර සමාලෝචිත වර්ෂයට අදාලව රු. 2,235,868.18 ක මුදලක් අය කරගෙන ඇත. ඇතැම් රාජ්‍ය ආයතනවලින් වරිපනම් බදු අයකර ගැනීම ගැටළු සහගත වී ඇති අතර එමගින් හිඟ මුදල් ඉහල යාමක් දක්නට ලැබේ. |
| (ii) | රීති 33 | ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහිදී පිළියෙල කර නොතිබුණි. | ගෙවීම් පැහැර හරින පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර සභාපතිවරයාට ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී සෑම කාර්තුවක් අවසානයේදීම හිඟ වාර්තා ලබාගෙන සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | 218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි වාර්ෂික සමීක්ෂණය කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් 2019 වර්ෂයේ සමීක්ෂණයක් සිදු කර නොමැත. 2020දෙසැම්බර් 31 දිනට වාර්ෂික සමීක්ෂණයක් සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**02. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.60,270,266 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.17,408,658 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2019 වර්ෂය** | | | | **2018 වර්ෂය** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල්කල ආදායම<br>රු. | රැස්කල ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගතආදායම<br>රු. | බිල්කල ආදායම<br>රු. | රැස්කල ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| වරිපනම් හා බදු | 7,320,062 | 54,607,886 | 6,760,982 | 2,183,647 | 7,010,062 | 6,860,062 | 4,372,827 | 4,772,157 |
| බදු කුලී | 16,076,000 | 16,076,000 | 16,659,781 | 7,083,169 | 19,066,000 | 19,066,000 | 16,178,203 | 4,861,492 |
| බලපත්‍ර ගාස්තු | 1,266,000 | 1,065,000 | 881,786 | 80,400 | 1,212,300 | 1,212,300 | 845,575 | 80,400 |
| වෙනත් ආදායම් | 97,940,116 | 97,740,116 | 19,620,699 | 28,627,925 | 74,394,914 | 74,394,914 | 68,761,436 | 26,616,340 |
| එකතුව | 122,602,178 | 169,489,002 | 43,923,248 | 37,975,141 | 101,683,276 | 101,533,276 | 90,158,041 | 36,330,389 |

සටහන:- මූල්‍ය ප්‍රකාශන ශේෂ හා සභාව විසින් විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අතර නොසැසඳීම් පැවතුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති හිඟය සහ සමාලෝචිත වර්ෂයේ බිල්කිරීමෙන්, රැස්කළ ආදායමට පසු තව දුරටත් අයවිය යුතු ශේෂ හා මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂ අතර නොසැසඳීම් පැවතුණි.

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතු වරිපනම් හා බදු ශේෂය රු. 2,183,647 ක් වුවද එම වටිනාකම් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ විය. නමුත් සභාව විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව රු.5,074,508 ක වරිපනම් බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉහත වරද Excel වැඩ පත්‍රිකා සම්බන්ධ කරගෙන ගිණුම පිළියෙල කිරීමේදී සිදුවූ වරදක් වන අතර නිවැරදි කර ඉදිරියේදී ගිණුම පිළියෙල කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**2.2.3 කුලී**

---------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථිර කඩ කාමර 22 කින් රු.428,409 ක්, එළවළු පළතුරු කුටි 06 කින් රු.75,030 ක් හා සෞඛ්‍ය හා පොදු පහසුකම් මධ්‍යස්ථානයෙන්රු.789,250 ක් අයවිය යුතුව පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරහිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා ලිපි යොමු කර ඇති අතර නියමිත කාලය තුල ගෙවීමට කටයුතු නොකලහොත් නීත්‍යානුකූලව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | බස් නැවතුම්පල කඩ කාමර සඳහා 2016 ජනවාරි 25 දින තක්සේරුවලැබීමෙන් පසුවනව ගිවිසුම් අත්සන් කර කුලී අය කිරීමට කටයුතු නොකිරීම මත 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,501,150ක ආදායමක් සමඟ 2019 වාර්ෂික තක්සේරු කුලිය සභාවට අහිමි වී තිබුණි. | නියමිත කුලී මුදල් අයකර සභාවේ ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | බිම් මහලේ කඩ කාමරවල කුලී මුදල් 2016 ජනවාරි 25 තක්සේරු වාර්තාවට අනුව අයකර ගැනීමට ක්‍රියාකරන බවත්, ගිවිසුම් අත්සන් කිරීමට අදාල කටයුතු කරමින් සිටින බවත් දන්වා සිටිමි. උඩු මහලේ කඩ කාමරවල බදු කුලී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | බස් නැවතුම්පල කඩ කාමර සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 15 කින් රු.688,385 ක් අයවිය යුතුව පැවති අතර,2020 ජූලි 13 දින වනවිට තවදුරටත් රු.564,500 ක් අයකර ගත යුතුව පැවතුණි. | මාසික කුලී හා හිඟ ශේෂ නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු. 123,885 ක මුදලක් අය කර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කාර්යය සාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 කට ඇතුළත් අනු කාරණා ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණු අතර සම්මත අතුරු ව්‍යවස්ථා හා වයඹ පළාත් අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඒ අනුව කටයුතු කර තිබුණි. පළාත් පාලන ආයතනය විසින් කුලී ත්‍රීරෝද රථ ගාල් කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවක් සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර වසර තුනක් ගතවී තිබුණද, ඒ සඳහා අනුමැතිය හිමිවී නොතිබුණි. | සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු අතර වැළඳගත් අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කළ යුතුවේ. | කුලී රථ ගාල් කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර එය සම්මත අතුරු ව්‍යවස්ථාවක් ලෙස පළාත් සභාව මගින් සම්මත කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව එවකට පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් වාචිකව දන්වන ලද හෙයින් එය අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය නවතා දමන ලද බව කාරුණිකව දන්වා සිටිමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්ව සිටියද 2019 වර්ෂය සඳහා ප්‍රමාණාත්මක හා සැලසුම් සහගත ලෙස ඉලක්ක, දර්ශක කල් ඇතිව ලේඛනගත කර ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කර ඉදිරි වර්ෂය සඳහා සැලසුම් සකස් කර නොතිබුණි. | අරමුණු හා ඉලක්ක ළඟාකරගත හැකිවන ආකාරයට අයවැය ලේඛන පිළියෙල කර වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. | " තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 " පිළිබඳව 2018 නොවැම්බර් 02 දින සභාවේ පුහුණු වැඩමුළුවක් පවත්වා කාර්යය මණ්ඩලයේ සියළු දෙනා දැනුවත් කරන ලදී. ඒ අනුව අයවැය ලේඛනය සකස් කිරීමේදී කුසගින්න පිටු දැකීම, සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම, කාන්තාව සවිබල ගැන්වීම භාමාත්‍ය සෞඛ්‍යය ඉහළ නැංවීම ඉලක්ක ලේඛනගත කර අවශ්‍ය වැඩසටහන් පවත්වා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිකවැරටිය පොදු පහසුකම් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කීමනී ක්‍රමයට කඩ කාමර ලබාගත් ටෙන්ඩර්කරුවන්ගෙන් ගිවිසුම් අත්සන් කර කුලී අය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.676,550 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | මෙම අඩුපාඩු කඩිනමින් නිවැරදි කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් අත්සන් නොකල සියළුම කඩහිමියන් වෙත ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දැනුම්දීම සඳහා ලිපි යවා ඇති අතර, කඩ කාමර ආරම්භ කල දිනයේ සිට හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව වාර්තා කරමි. |
| (ආ) | පොදු පහසුකම් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කඩ කාමර බදුදීමට අදාළ ගිවිසුම ප්‍රකාරව බදුකරු විසින් කඩ කාමර අන්සතු කිරීම නොකළ යුතු වුවද බදුකරුවන් තුන් දෙනෙකු විසින් කඩ කාමර උපබදු දී තිබුණි. | උප බදුදීම් සම්බන්ධයෙන් කටයුතු කර ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල් අයකළ යුතුවේ. | ගිවිසුම් ප්‍රකාරව උප බදුදීම කල නොහැකි බව පිළිගනිමි. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කරමි. මුදල් නොගෙවන සියළු වත්කම් මුද්‍රා තැබීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.107,562,587 ක් වූ අතර එම ශේෂය තුළ වසර 01 ට වැඩි, 03 ට අඩු රු.10,281,370 ක් ද, වසර 03 ට වැඩි 05 ට අඩු රු. 4,868,954 ක් ද හා වර්ෂ 05 ට වැඩි රු. 842,470 ක ශේෂ පැවතුණද එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. 2020 ජූලි 13 දින වන විට තව දුරටත් රු.106,553,640 ක් නිරවුල් කළ යුතුව තිබුණි. | තවදුරටත් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ටෙන්ඩර් තැන්පත් යටතේ රු.750,178.33 ක වටිනාකමක් ආදායමට ගන්නා ලද අතර රු.258,768.74 ක වටිනාකමක් නිදහස් කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ද්විතීක තනතුරු 28 ක් අනුමතව තිබුණු අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 42 ක් විය. එහි 14 ක අතිරික්තයක් හා 07 ක පුරප්පාඩු පැවතුණි. ප්‍රාථමික අංශයේ තනතුරු 12ක පුරප්පාඩු හා අතිරික්තතා 03 ක් ද විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කරගැනීමටත්, කටයුතු කළ යුතුවේ. | ද්විතියික කාර්යය මණ්ඩලය අනුමත සංඛ්‍යාවට වඩා වැඩිවීමට හේතු වූයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරි 21 දෙනෙකු සිටින බැවිනි.<br>එමෙන්ම පුරප්පාඩු 07 ක්ද ඇත. |

## 3.4 ප්‍රසම්පාදනය

### 3.4.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිමි වැඩ වටිනාකම රු.1,699,201 ක් වූ ගිරිඋල්ල නැබඩ මාර්ගය තාරදමා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ පැවති අඩුපාඩු පිළිබඳව අවධානය යොමු නොකර සභාවේ තාක්ෂණික නිලධාරී, පළාත් පාලන ඉංජිනේරුවරිය හා නිර්මාණ වැඩ අධිකාරිගේ නිර්දේශ මත රු. 169,920 ක රැඳවුම් මුදල් නිදහස් කිරීම අනුමත කර තිබුණි. එහෙත් මාර්ගය භෞතිකව පරීක්ෂා කිරීමේ දී මාර්ගයේ කෙළවරවල් ගැලවීමට ලක්වීමහාමාර්ගය ආරම්භයේ සිට මීටර් 20 දක්වා වූ කොටස තුළ මාර්ගය පුපුරා වලවල් ගණනාවක් සෑදී තිබුණි. | පවතින අඩුපාඩු සකස් කළ යුතුවේ. | රැඳවුම් මුදල් මගින් අදාල අඩුපාඩු සකස් කිරීමට ඇස්තමේන්තු සකස් කර කමිටු අනුමැතිය ලබාගෙන ඇත. මෙම මාර්ගය කාපට් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති නිසා මෙම සකස් කිරීම අනවශ්‍ය බවට ගරු සභාපතිතුමා විසින් වාචිකව උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු විසින් 2018 අගෝස්තු 09 දින ගල්පානව මොන්නැකුලම මාර්ගය හා උඩුනෝව ගල්පානව මාර්ගය පරීක්ෂා කර chip sealing කිරීමට වාචිකව උපදෙස් ලබා දී තිබුණද 2020 ජූනි 08 දින වන විටත් ඊට අදාළ අළුත්වැඩියා සිදුනොකිරීම හේතුවෙන් තවදුරටත් මාර්ගය පළුදුවී තිබුණි. | උපදෙස් පරිදි අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | Chipsealing කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර කමිටු අනුමැතිය ලබා ගෙන ඇත. හැකි ඉක්මනින් මෙම කටයුතු නිම කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |